# සමාජ අධ්‍යයන අරමුණු සංජානනය
# පිළිබඳ තරා විශ්ලේෂණයක්.

ඉන්ද්‍රාණි ධර්මදාස
විසිනි.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ (අධ්‍යාපන පීඨයේ)
අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය සම්බන්ධ අවශ්‍යතා
අර්ධ වශයෙන් පූරණය කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන
පර්යේෂණාත්මක නිබන්ධයකි.

1981

356498

නිබන්ධ උපදේශක
ආචාර්ය එච්. යූ. සේදර

## සාරාංශය


සමාජ අධ්‍යයන විෂය හා බැඳුණු විවිධ අරමුණු හඳුනා ගැනීමත්; සමාජ අධ්‍යයන විෂයමාලාව පිළියෙල කිරීමේ නිරත පුද්ගලයන්, විෂය උගන්වන ගුරුවරුන් සහ ඉගෙනුම ලබන සිසුන් හඳුනාගනු ලැබූ සමාජ අධ්‍යයන විෂය ඉගැන්වීමේ අරමුණු සංජානනය කරන ආකාරය අනුව දෙනු ලබන වැදගත්කම පිළිබඳ තරා විශ්ලේෂණයක් කිරීමත් මෙම අධ්‍යයනයේ මූලික අරමුණ විය.

1972 දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පරිපාටිය තුළට විෂයයක් වශයෙන් සමාජ අධ්‍යයනය පිවිසියද ශ්‍රී ලංකාවේ සමාජ අධ්‍යයන විෂය සම්බන්ධව පළවී ඇති පත පොත මෙන්ම, කෙරී ඇති පර්යේෂණද අල්පය. අරමුණු නිශ්චය තර ගැනීම අධ්‍යාපන ක්‍රියාවලියක මූලික අවශ්‍යතාවක් වුවද ශ්‍රී ලංකාවේ සමාජ අධ්‍යයන විෂය ඉගැන්වීමේ අරමුණු සම්බන්ධව යොමුවී ඇති අවධානය ප්‍රමාණවත් නොවේ. මෙකී අවශ්‍යතාව අල්පවශයෙන් හෝ පූර්ණය කිරීමේ අභිලාශයෙන් මෙම පර්යේෂණය කෙරින.

මෙහිදී සමාජ අධ්‍යයන ගුරුභවතුන්, විෂයමාලා තැනීමෙහි නිරත වූවන්, ගුරු උපදේශක භවතුන්, විශ්ව විද්‍යාල හා ගුරු විද්‍යාල කථිකාචාර්යවරුන් යන පිරිස් වලින් ලබාගත් අපේක්ෂණ ලැයිස්තු හා අදහස්ද; ලෝකයේ විවිධ රටවල සමාජ අධ්‍යයන විෂය ඉගැන්වීම සඳහා ප්‍රකාශකොට ඇති අපේක්ෂණද අලලමින් අපේක්ෂණාවලියක් සකස් කෙරිනි. පුළුල්ව ලියවුණු විෂය අපේක්ෂණ 31 කින් සමාජ අධ්‍යයනය ඉගැන්වීම සඳහා සම්මත කොටගත් අපේක්ෂණ වැල සමන්විතය.

මහනුවර, මාතලේ හා නුවරවළිය යන අධ්‍යාපන දිස්ත්‍රික්කයන් ප්‍රධාන කොට ගෙන එකී අපේක්ෂණ 31 ගුරුවරුන්, ශිෂ්‍යයන් හා විෂයමාලා තනන්නන් සංජානනය කළ ආකාරය යුග්ම සැසඳුම් ( Paired Comparison ) පිළිවෙත යොදාගෙන විමසන ලදී. ග්‍රාමීය/නාගරික බව, ස්ත්‍රී/පුරුෂ භාවය:, ගුරුවරුනගේ අධ්‍යාපනික සුදුසුකම් වැනි ස්වායත්ත සාධක මත යුග්ම සැසඳුම් දත්ත විග්‍රහයට ලක් කෙරුණු අතර එම විග්‍රහය තුළින් විෂයමාලා තනන්නන්, ගුරුවරුන් හා ශිෂ්‍යයන් අතර විෂය ඉගෙනුම් අපේක්ෂණ සංජානනයේ පවත්නා සංගතතා හා අසංගතතාවන් විවරණය කොට ඇත.


356498

(1) ඉගෙනුම ලබන ශිෂ්‍යයාගේ නාගරික/ග්‍රාමීය බව අරමුණු සංජානනයේදී වෙසෙසි සාධකයක්වීම, පර්යේෂණ අනාවරණයන් අතර ප්‍රධාන වේ.

(2) ස්ත්‍රී/පුරුෂ භාවය මත සැලකූ කල ග්‍රාමීය සිසුනට වඩා නාගරික සිසුන් අතර අරමුණු සංජානනයේ වෙසෙසි වෙනස්කම් දක්නට ලැබිණ.

(3) ගුරුවරුන්ගේ විවිධ සහතික මට්ටම් අරමුණු සංජානනය කෙරේ වෙසෙසිව බලපාන බැව් මෙම අධ්‍යයනයෙන් හෙළිවේ.

(4) ශිෂ්‍යයන් හා විෂයමාලා තනන්නන් අතර අරමුණු සංජානනය පිළිබඳ වැඩි එකඟතාවක් ඇත. ගුරුවරුන් හා ශිෂ්‍යයන් අතර අරමුණු සංජානනය පිළිබඳව පවතින එකඟතාව ශිෂ්‍යයන් හා විෂයමාලා තනන්නන් අතර පවත්නා එකඟතාවට වඩා වෙසෙසි ලෙස අඩු එකඟතාවකි.

(5) ඇතැම් සහතික මට්ටම්වල ගුරු පිරිස් හා ශිෂ්‍යයන් අතර අරමුණු සංජානනයේ වැඩි එකඟතාවක් දැකිය හැකිය.

(6) අධ්‍යයන අරමුණුවල සංජානන වට්නාකම් අනුව කෙරෙන තරා විග්‍රහය තුළින් සමාජ අධ්‍යයන විෂය ඉගැන්වීමේ විඥානික, ආවේදනික, මනෝචාලක ක්ෂෙත්‍රයන් තුනට අමතරව පෞද්ගලිකත්වය පෝෂණය ලෙස මෙහි නම් කෙරෙන සිව්වන ක්ෂෙත්‍රයක්ද හඳුනාගත හැකි බැව් පර්යේෂණ දත්ත හෙළි කරයි.